සේවා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2027

නිවාස, ඉදිකිරීම් හා ජල සම්පාදන අමාත්‍යාංශය

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

1. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ප්‍රධාන කාර්යාලය, අනුරාධපුර ගල්කුලමෙහි පිහිටි ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්ප විදුහල, පැල්වත්තෙහි පිහිටි ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු ආයතනය (CETRAC) හා ඉදිකිරීම් කර්මාන්ත පුහුණු ආයතනය (CITI) යන අංශ සඳහා 2027 වර්ෂයට අවශ්‍ය පහත සඳහන් සැපයුම් හා සේවාවන් සැපයීම වෙනුවෙන් ලියාපදිංචි වීම සඳහා 2026.11.20 දින සිට 2026.12.15 දින දක්වා අයදුම් පත් කැඳවීම සිදුකරනු ලබයි.

	A - සැපයුම්	අයිතම අංකය
01	සියලුම කාර්යාල ලිපි ද්‍රව්‍ය හා කාර්යාල උපකරණ	1.1
02	කාර්යාල උපකරණ (ප්‍රින්ටර්, ෆොටෝ කොපි යන්ත්‍ර, රොනියෝ යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර ආදිය)	1.2
03	කාර්යාලීය ගෘහ භාණ්ඩ (ලී, ස්ටීල් හා ප්ලාස්ටික්)	1.3
04	පරිගණක, පරිගණක අමතර කොටස් හා ජාලකරණ උපාංග	1.4
05	දොර,ජනෙල් තිර රෙදි හා නිළ ඇඳුම් සඳහා වන රෙදිපිළි ද්‍රව්‍ය	1.5
06	ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ	1.6
07	වායු සමීකරණ හා උපාංග	1.7
08	මෝටර් රථඅමතර කොටස්	1.8
09	ටයර්,වියුබ්, බැටරි (Wheel Alignment and Balancing ඇතුලුව)	1.9
10	සියලුම ගොඩනැගිලි ද්‍රව්‍ය (ඉදිකිරීම් කටයුතු සඳහා අමුද්‍රව්‍ය, විදුලි අමතර උපාංග, වීදි ලාම්පු, ජල නළ අමතර උපාංග)	1.10
11	බෝතල් කළ පානීය ජලය හා ජල සම්පාදන (Water Supply) උපකරණ	1.11
12	පාරිභෝගික ද්‍රව්‍ය	1.12
13	කාර්මික නිෂ්පාදන හා අමුද්‍රව්‍ය	1.13
14	වාහන ආසන කවර යෙදීම හා කුෂන් කිරීමේ කටයුතු	1.14
15	මුද්‍රණ කටයුතු හා පොත් බැඳීම	1.15
	B - සේවා	
01	ඕෆ් සෙට් හා ඩිජිටල් මුද්‍රණ කටයුතු	2.1
02	තැගි භාණ්ඩ හා සිහිවටන, ලෝහමය ලාංඡන කුසලාන හා පදක්කම්, නාම පුවරු සාදා සැපයීම	2.2
03	වාහන වාර සේවා කටයුතු (බස් රථද සහිතව)	2.3
04	වාහන ටින්කරින් කිරීම, පේන්ට් කිරීම, කට් ඇන්ඩ් පොලිෂ් කිරීම	2.4
05	වාහන කුෂන් වැඩ හා ඇතිරිලි වැඩ	2.5
06	වාහන වායුසමනය කිරීම	2.6
07	වාහන කුලියට ගැනීම (කාර්/ වෑන්/ ලොරි/ බස්)	2.7
08	කෘමි උවදුර පාලනය සේවාව	2.8
09	කාර්යාල බෙදා වෙන් කිරීම (Partitioning)	2.9
10	ඉසව් කළමනාකරණ සේවාව (Event Management)	2.10
11	පරිගණක මෘදුකාංග වැඩිදියුණු කිරීමේ සේවාව	2.11
12	මුද්‍රණ අංශයේ භාවිතා කරනු ලබන යන්ත්‍ර අලුත්වැඩියා කටයුතු	2.12
13	කාර්යාලීය ගෘහ භාණ්ඩ හා කුෂන් පුටු අලුත්වැඩියා කිරීම	2.13
14	පරිගණක හා ඊට අදාල අමතර උපාංග අලුත්වැඩියා කිරීම	2.14
15	ලැප්ටොප් පරිගණක, බහුමාධ්‍ය ප්‍රොජෙක්ටර්, ප්‍රොජෙක්ටර් තිර හා ඊට අදාල උපකරණ අලුත්වැඩියා කිරීම	2.15
16	වායුසමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම	2.16
17	ගොඩනැගිලි නඩත්තු සේවා (පෙදරේරු, වඩු කාර්මික, ජලනල කාර්මිකයන්) C9 ශ්‍රේණිය	2.17
18	විදුලි කාර්මිකයන් (EM 5 ශ්‍රේණිය)	2.18
19	ගොඩනැගිලි පින්තාරු කටයුතු (SP 5 ශ්‍රේණිය)	2.19

1. එක් එක් සේවාවක් වෙනුවෙන් සැපයුම්කරුවන් වෙන් වෙන් වශයෙන් අයදුම්පත් යොමු කළ යුතුය. දැනටමත් සැපයුම්කරුවෙකු වශයෙන් මෙම අධිකාරියේ ලියාපදිංචි වී සිටින අයදුම්කරුවන් ද නැවත 2027 වර්ෂයට ලියාපදිංචි විය යුතුය.

2. එක් අයදුම්පතක් සඳහා රු.1000.00 ක (වැට් සහිත) ආපසු නොගෙවන තැන්පතුවක් ගෙවිය යුතුය. එම අයදුම්පත හා සියලු තොරතුරු හා කොන්දේසි www.cida.gov.lk යන වෙබ් අඩවියෙන් භාගත කළ හැක.

එම එක් අයදුම්පතක් සඳහා ආපසු නොගෙවනු ලබන තැන්පතුව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලංකා බැංකුවේ ටොරින්ටන් ශාඛාවේ 007745497 දරණ ජංගම ගිණුමට බැර කර හෝ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ මුදල් අයකැමි වෙත අදාළ අයදුම්පත සඳහා ලියාපදිංචි ගාස්තුව තැන්පත් කර අදාළ මුල් රිසිට්පත අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.

3.සැපයුම්කරු VAT බදු ගෙවීම සඳහා ලියාපදිංචි වී ඇත්නම් 2026 වර්ෂයට අදාළ VAT බදු අංකය සඳහන් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් ලබාගත් සහතිකයේ පිටපතක් අයදුම්පතට අමුණා සම්පූර්ණ කරන ලද අයදුම්පත් අදාළ ලේඛන සමග එවිය යුතුය. එසේ ඉදිරිපත් නොකරන අයදුම්කරුවන් VAT බදු සඳහා ලියාපදිංචි වී නොමැති බවට සලකනු ඇත.

4. සැපයුම්කරුවෙකු ලෙස ලියාපදිංචි වීමට අදාළ අයදුම්පත සමග පහත ලේඛන ඉදිරිපත් කළ යුතුය.

1. ව්‍යාපාරික ආයතනයේ නම හා ස්වභාවය
2. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ ඡායා පිටපත්
3. VAT ලියාපදිංචි සහතිකය
4. පසුගිය වසර 03 ක එම සේවාව සැපයීමට අදාළ පලපුරුද්ද අදාළ ආකෘතියට අනුව සම්පූර්ණ කර ඇමුණිය යුතුය.
5. සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ වර්ගීකරණය යටතේ B සේවා අංශය යටතේ,

B - සේවා කාණ්ඩය	ලියාපදිංචි ශ්‍රේණිය
අංක 17	C9 ශ්‍රේණිය
අංක 18	EM 5 ශ්‍රේණිය
අංක 19	SP 5 ශ්‍රේණිය

යන ශ්‍රේණිවල ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචි වී තිබිය යුතුය. (ලියාපදිංචියට අදාළ පොතෙහි පිටපතක් ඇමුණුම් කර තිබිය යුතුය)

5. සියලුම අයදුම්පත් ලියුම්කවරයේ ඉහළ කෙළවරේ “සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2027” යනුවෙන් සඳහන් කර 2026.12.15 දින හෝ ඊට ප්‍රථම අංක 123, සවිසිරිපාය, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය ලියාපදිංචි තැපෑලෙන් හෝ ඉහත ලිපිනයෙහි බිම් මහලෙහි තබා ඇති “සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2027” යන්න සඳහන් පෙට්ටියට බහාලන්න.

6. විමසීම් - දුරකථන අංක, 011-2699801, 011-269166, විද්‍යුත් තැපෑල - ictadsupply@gmail.com

අධ්‍යක්ෂ ජනරාල්,

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය,

සවිසිරිපාය,123, විජේරාම මාවත,

කොළඹ 07